## කුඩාවැව් පුනරුත්ථාපනය සහ පරිසරය

# අමතක කළ පැත්තක්

සුළු යෝජනාක්‍රම වශයෙන් සාමාන්‍යයෙන් හැඳින්වෙන කුඩාවාරිමාර්ග වැව් වශයෙන් සැලකෙන්නේ හෙක්ටාර් 80 කට අඩු වපසරියකට ජලය සැපයෙන වාරිමාර්ගයි. මේ වැව්වලින් බොහොමයක් වසර 2000 කට ඉහත දී ඉදිකරන ලද ඒවායි. මුල්කාලයේ.සිට ඒවායින් වගාවට ජලය සැපයුනු අතර, මූලිකවශයෙන් වැව් විසිදහසක් ක්‍රිස්තුවර්ෂය ආරම්භයට පෙර තනන ලද අතර අදත් ඒවායින් වගාවට ජලය සැපයේ. ඒනිසා පුරාතන යුගයේ සිට එම කුඩා වැව් සමාජ සංස්කෘතික හා කෘෂි ජීව පරිසරයට අනුගත බව සැලකිය හැකිය.

මේ වැව්වලින් සමහරක් ජරාවාස වී ඇති අතර, වැව් පුනරුත්ථාපනය සඳහා වැඩසටහන් කීපයක් අරඹා ඇත. පුනරුත්ථාපනය සඳහා 1970 ගණන්වල මුල් භාගයේ දී උත්සාහ කෙරිණ. කුඩා වැව් පවතින පරිසරයට හැඩගැසී තිබුණු බැවින් අතීතයේ දී පරිසර සංරක්ෂණය ගැන සිතීමට අවශ්‍යතාවක් නොතිබෙන්නට ඇත. ඒ අනුව අතීතයේ පුනරුත්ථාපන වැඩසටහන්වලදී පරිසරික මාන සැලකිල්ලට ගෙන නැත. එහෙත් මෑතදී කුඩා යෝජනා ක්‍රම ආශ්‍රිතව කෙරුණු සමීක්ෂණ හා නිරීක්ෂණ අනුව බරපතල පරිසර ගැටළු මතුවෙමින් තිබෙන බව දැන් අවබෝධ කරගෙන ඇත. දිවයිනේ කුඩා වැව් 1000 කට වැඩි සංඛ්‍යාවක් පුනරුත්ථාපනය කෙරෙන ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ මේ ගැටළු නිරාකරණය කෙරෙන බව සඳහන් කළ හැකිය. ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියේ තෝරාගත් කුඩා යෝජනා ක්‍රම පුනරුත්ථාපන ක්‍රියාවලියේ දී පරිසර සංරක්ෂණය වෙනුවෙන් ඇතැම් නිශ්චිත ක්‍රමෝපායන් සකස් කෙරේ. රටේ කුඩා වාරිමාර්ග පුනරුත්ථාපන ක්‍රියාවලියේ දී සැලකිල්ලට ගත යුතු වැදගත් පරිසර ගැටළු සමහරක් මේ ලිපියෙන් සාකච්ඡා කෙරේ.

### මානක තුන

කුඩා යෝජනා ක්‍රමවල පරිසරයට අදාල මූලික මාන තුනක් තිබෙන අතර එම වැව් පුනරුත්ථාපන ක්‍රියාවලියේ දී ඒවා සැලකිල්ලට ගත යුතු ය. වත්මන් පාරිසරික ගැටළු, පුනරුත්ථාපනය නිසා මතුවිය හැකි ගැටළු හා දැනට පවතින ගැටළු මෙන්ම නව ගැටළු නිවැරදි කෙරෙන ක්‍රමෝපායන් ඒවාය. මෙම මාන පිළිගැනීම


අනුර එස්. විදානපතිරණ
කෘෂිකාර්මික ආර්ථික උපදේශක


වැදගත්වේ. එමෙන්ම මේ යෝජනා ක්‍රම සමඟ පවතින පරිසර ගැටළු පිටුදැකීම සඳහා ඒවා හොඳින් අධ්‍යයනය කළ යුතුයි.

### දැනට ඇති ගැටළු

ප්‍රධාන වශයෙන් ජනගහනය වෙනස සහ ඉඩම් සහ සෙසු සම්පත් පරිහරණ රටා වෙනස්වීමේ ප්‍රතිඵලය ලෙස කුඩා වැව් යෝජනා ක්‍රම ආශ්‍රිතව විවිධාකාර පරිසර ප්‍රශ්න ඉස්මතු වී තිබේ. දැනට පවතින පරිසර ගැටළු විවිධය. සංකීර්ණය. ප්‍රශ්නයේ බැරෑරුම්කම රඳා පවතින්නේ යෝජනා ක්‍රමයේ පිහිටීම හා කෘෂි-පාරිසරික ක්ෂේත්‍රයට අදාල විශේෂිත තත්ත්වය මතය.

බොහෝ වැව්වල පෝෂක ප්‍රදේශවල හේන් ගොවිතැන, වැවිලි සහ නිවාස තැනීම ආදිය මගින් ඉඩම් පරිහරණය කෙරෙන බැවින් වන ආවරණ අඩුවෙයි. ප්‍රධානම පරිසර ප්‍රශ්නය පස සේදීයාමයි. එය පෝෂක ප්‍රදේශයේ හෝ වැව අවට සිදු විය හැකිය. ඉහල ජලධාර ප්‍රදේශවල ඉඩම් නිසි පරිදි සහ සතුටුදායක අන්දමින් පරිහරණය නොකිරීමෙන්

පස සෝදායාමට අනුබල ලැබෙයි. අයෝග්‍ය ලෙස කෘෂි රසායන භාවිතය - ඉඩම් අස්වැද්දීම සහ වෙනත් කෘෂිකාර්මික පරිචයන් පස සෝදායාමට පමණක් නොව වාරිමාර්ග ජලයේ හා භූගත ජලයේ පවා ගුණාත්මක තත්ත්වය හීනවීමට දායක වෙයි. ඇතැම් ප්‍රදේශවල ගෙවල්වල ප්‍රයෝජනයට ජලය ලබාගන්නා ළිං සහ කෘෂි ළිංවල ජලයෙන් දැනටමත් නයිට්‍රජන් විශාල ප්‍රමාණයක් අඩංගු බව වාර්තා වී ඇති අතර ඉන් පෙන්නුම් කෙරෙන්නේ රසායනික පොහොර භාවිත පුරුදු සතුටුදායක නොවූ, දුබල තත්ත්වයක පවතින බවයි. වනගහණය අඩුවීම පසෙහි ඓන්ද්‍රිය ද්‍රව්‍ය ප්‍රමාණවත් නොවීමට දායකවන තවත් සාධකයකි. ඓන්ද්‍රිය ද්‍රව්‍ය මගින් පොහොර සහ සෙසු රසායන රඳවා තබා ගැනෙන අතර ඒවා ජලමාර්ග දෙසට ඇදීයාම වලක්වයි. තෙවනුව - දැනට ඇති ගස්කොලන් ඉවත් කිරීම හා නැවත වනවගා වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම පස සෝදායාමට හේතුකාරක වෙයි. එමෙන්ම ජලය ගලායන රටාව විකෘති කොට ජල සම්පත් ජරාවාස කෙරේ.

හතරවන ගැටළුව රොන්මඩවලින් වාරිමාර්ග ඇල මාර්ග, වාරිපෝෂක කෙත්බිම් සහ සෙසු නිර්මිත පිරියාමයි. එයින් අතිරේක ගැටළු පැනනගී. වියදම වැඩිවෙයි.

අවසාන වශයෙන්, නාගරික හා කාර්මික මධ්‍යස්ථානවලට යාව පිහිටි යෝජනා ක්‍රමවල වාරිමාර්ග ඇල මාර්ග පද්ධතියට දූෂණකාරක ද්‍රව්‍ය දමනු ලැබේ. එමගින් ඇලමාර්ග පරිසරය පරිහානියට ලක්වෙයි. උදාහරණයක් වශයෙන් කුරුණෑගල නගරාසන්නේ පිහිටි යෝජනා ක්‍රමයක් ගරාජයක අපද්‍රව්‍යවලින් දූෂණය වී තිබේ. ප්‍රධාන වාරිමාර්ග ඇලෙහි දෘශ්‍යමාන සියලු ජීවීන් එමගින් වැනසී ගොස්ය. ගම්පොල නගරාසන්නයේ පිහිටි යෝජනා ක්‍රමයක ජලය කැලිකසල හා වී තැම්බීමෙන් පසු ඉවතලන ජලයෙන් දූෂණය වී ඇත. ප්‍රධාන වශයෙන් මේ දූෂණකාරක නිසා ඇලෙහි මාළු වඳ වී ගොසිනි. කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන දූෂණ කාරකය ඇල මාර්ගවලට ගලායන රබර් කිරිය. මහනුවර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග ඇල්වල්වලට දමන දහයියා සහ ලීකුඩු ඒවා අපවිත්‍රවීමේ ප්‍රධාන හේතුකාරකය.

මේ යෝජනා ක්‍රමවල සාමාජීය පරිසරයට හානිකර වන තවත් බරපතල ගැටළුවක් වන්නේ ජනපදිකයන් අතර සාමාජීය වශයෙන් අවංකකම නොමැතිවීමයි. අතීතයේ දී සුළු වාරිමාර්ග යෝජනා ක්‍රමවල ජනතාව දැඩි එකමුතු බැම්මකින් බැඳී සංවිධානය වී සිටි බවක් පෙනේ. එම සාමාජීය බැඳීම් විනාශ කරනු ලැබ ඇති අතර, මේ යෝජනා ක්‍රමවල සාමාජීය ගැටළු සමහරක් දැන් පෙන්නුම් කෙරෙයි. මේ සාමාජීය බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස තමන් සතු ඉඩම්වලින් හා ජලසම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට පවා උත්සුක නොවූ අවස්ථා ඇති අතර, කිසිම ජලහිඟයක් නැති අවස්ථාවලදී පවා එම තත්ත්වය දක්නට පුළුවන.

## පුනරුත්ථාපනයෙන් පැනනැගුණු ගැටළු.

මීට පෙර පෙන්වා දුන් පරිදි අතීතයේ පුනරුත්ථාපන ව්‍යාපෘතිවලදී පරිසරය රැකගැනීම කෙරෙහි විශේෂිත අවධානය යොමු කොට නැත. අතීතයේ වැඩසටහන් හා ව්‍යාපෘතිවල පරමාර්ථය වී ඇත්තේ පරිසරය රැක ගැනීම කෙරෙහි වැඩි සැලකිල්ලක් නොදක්වමින් පුනරුත්ථාපනය සම්පූර්ණ කිරීමයි.

මේ නිසා මේ ව්‍යාපෘති මගින් හඳුන්වා දෙන ඇතැම් දේ පරිසර ගැටළුකාරක වෙයි. වලවල් හෑරීම - ගස්කොලන් ඇති ඉඩම් මුඩුඉඩම් බවට පත් කිරීම. ගස් කොලන් ඒවායේ නොවැවීම, සාමාජීය ඒකාග්‍රතාව ප්‍රවර්ධනය ආදිය සඳහා වැඩසටහන් නොමැතිවීම උදාහරණ ලෙස දැක්විය හැකිය. භාරාදමන ලද වලවල්වල වැසිජලය එක් රැස්වීමෙන් මදුරුවන් බෝකරන ස්ථාන බවට ඒවා පත්වීමෙන් බැරෑරුම් පාරිසරික ප්‍රශ්න ඇති කෙරේ. අහිමි වී ගිය ගස කොළ යළි වවා ඇති එකම ව්‍යාපෘතියක්වත් සොයා ගැනීමට නැත. පන්, උණ, බට ආදිය වාරිමාර්ග සමීපයේ තිබෙන අතර. මෙම ප්‍රදේශ ශුද්ධ පවිත්‍ර කොට ඒවා විනාශ කර දැමීමෙන් සාමාජීය ප්‍රශ්න ඇති වෙයි.

මේ භූමිවලින් ග්‍රාමීය ජනතාවට රැකියා අවස්ථා උදාවන අතර, ඒවා නැතිවී යාම බරපතල සාමාජීය ප්‍රශ්ණයක් ලෙස සලකනු ලැබේ. දේපල අයිතිය සහ ප්‍රතිලාභහිමිවන්නන්ගේ සහභාගිත්වය අඩුවීම ඇතුළත් අදාල ගැටළු කෙරෙහි නිසි සැලකිල්ල නොදැක්වීමේ අඩුපාඩු නිසා ඇතැම් ව්‍යාපාරවල කොන්ක්‍රීට් නිර්මිති ඉදිකිරීම් පටන් ගත් අවස්ථා නැත. එම ව්‍යාපාර පැහැදිලිවම ජනතාවට අයිති ඒවායි. එය මේ යෝජනාක්‍රම කෙරෙහි ග්‍රාමීය ජනතාව තුළ පවතින සාමාජීය අවංකභාවය පලුදු කොට ඇත. 1980 ගණන්වල මුල්භාගයේ ඉදිකරන ලද ඇතැම් ව්‍යුහ මේ දක්වා එකම වරක් හෝ ප්‍රයෝජනයට ගෙන නොමැති බව සඳහන් කරන්නේ කණගාටුවෙනි. එවැනි තැනීම් ජනතාවට සැබැවින්ම අවශ්‍යවූයේ දැයි ප්‍රශ්න කළ හැකිය. ඔවුන්ගෙන් ඇතමෙකුට මේ නව ව්‍යුහ මෙහෙයවීමට හෝ නඩත්තු කිරීමට දැනුම හෝ කුශලතා නොතිබෙන්නට පුළුවනි.

## ක්‍රියාකාරී වැඩසටහන

ශත වර්ෂ ගණනාවක් මුළුල්ලේ ජනතාව හා ස්වභාවධර්මය සමඟ සුසමතාව පැවති කුඩා යෝජනා ක්‍රම මුහුණපාන පරිසර ගැටළුවල බරපතල තත්ත්වය නිසා අනාගත ව්‍යාපෘති හා යෝජනා ක්‍රම වල පුනරුත්ථාපන ක්‍රියාවලිය

සමඟ පාරිසරික වශයෙන් හිතකර පරිචයන් සමුදායක් ක්‍රියාවට නැංවීම ඉතා වැදගත්ය. මේවාට මැදිවී ඇති ගැටළු මූලධර්ම කීපයක් අනුව පෙන්නුම් කළ හැකිය.

පළමුවැන්න මෙයයි. ප්‍රතිලාභ ලබන්නන්ගේ පූර්ණ සහභාගිත්වයෙන් යුතුව ආරම්භයේ සිටම හොඳින් සැලසුම්ගත වැඩසටහන් සකස් කර ගත යුතුයි. එවන් වැඩසටහනකට දැනුම ගොඩනැගීම පුහුණුව හා ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය රෝපන ද්‍රව්‍ය සැපයීම වැනි දේ ඇතුලත්විය යුතුයි. දෙවනුව, පාරිසරික ගැටළු අවම කිරීමේ වැඩසටහනකට දැනට පවතින පරිසරය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයන් සමඟ සුපරීක්ෂාකාරී සැලසුම්කරණය, භාරන ප්‍රදේශවල ඉදිකිරීමේ ක්‍රමය, කැනීම් හා සංවර්ධනය නිමවූ පසුව එම ප්‍රදේශ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය සහ දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන කරුණු ඇතුලත් විය යුතුයි. සියලු පාරිසරික ප්‍රශ්න විශ්ලේෂණයට ඇතුලත්විය යුතු අතර පුනරුත්ථාපන කටයුතු නිසා මතුවිය හැකි නව ගැටළු අවම විය යුතුයි. පුනරුත්ථාපන කටයුතු නිසා පැනනැගිය හැකි පාරිසරික ප්‍රශ්න අවම කිරීමට ප්‍රමාණවත් සැලකිල්ල දක්වා ක්‍රියා කළ යුතුයි. ප්‍රතිලාභ ලබන්නන් විසින්ම පාලනය කරගනු ලබන පැලතවාන් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් ලෙස මුදල් සහ වෙනත් ආධාරක සැපයීම සැලසුම්කරණයට ඇතුලත් විය යුතුයි. යෝජනා ක්‍රමවල කැනීම් කැනීම් ඉදිකිරීම් ආදිය ආරම්භවීමට ටික කලකට පෙර පැලතවාන් ඇති කළ යුතුයි. පැල සිටුවීම හැකි සෑම විටකදී ම කැනීම් කටයුතු සමඟ සිදුකළ යුතුයි. ඒ වන විට කැනීම් ඉදිකිරීම් වැඩ නිමයි. සිටුවන ලද පැල මුල් ඇදගෙන වැඩෙමින් පවතී. ස්වාභාවික බලවේගවලට පස ගොදුරුවීම අවම වේ. එවිට පස අවකැන්වීම අඩුවී පරිසරය සුරැකෙයි.

තෙවනුව, වලවල් හෑරූ ප්‍රදේශවල පැවති වෘක්ෂලතාදියෙන් කොටසක් කපා උගුල්ලා නො දමා එම ප්‍රදේශයේ තිබීමට ඉඩ හල යුතුයි. කැනීම් ක්‍රියාවලියේ දී එම ගස් ඉවත් නොකල යුතුයි. (1) හැකි හැමවිටම පවතින ගස් කොළන් කපා ගලවා ඉවත් කිරීම අවම තත්ත්වයෙන් පවත්වාගෙන යාමට උත්සුක විය යුතුය. වලවල් හෑරීමේ දී මතුපිට පස වෙනම එක්රැස් කර ගත යුතු අතර, ඉවමේ බෑවුම දිගේ වලවල් හෑරිය යුතුවේ. එයින් ස්වභාවයෙන් සිදුවන ජලාපවහනයට පහසුකම් සැලසෙන අතර වැසි ජලය එකතුවීම වැලැක්විය හැකිය.

සිව්වැනිව, පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් යෝජනා ක්‍රමවල කැනීම් ඉදිකිරීම් කටයුතු ආරම්භ කෙරෙන කාලයේ දී ඇරඹිය යුතු අතර ඒවායේ අරමුණ විය යුත්තේ පරිසර සංරක්ෂණය ගැන ජනතාවට ඉගැන්වීමයි.

පොහොර හා රසායන භාවිතය - රුක් රෝපනය හා ඒවා රැකබලා ගැනීම - පස හා තෙතමනය රැකගැනීම වැනි පරිසරයට සම්බන්ධ හැම පැත්තක්ම ආවරණය වන අයුරින් අධ්‍යාපන වැඩසටහන් පුළුල් ලෙස සම්පාදනය වී තිබීම වැදගත් ය. පුනරුත්ථාපන වැඩ සැලසුම් කළ යුත්තේත් ඒවා ක්‍රියාත්මක කළ යුත්තේත් ඉන් ප්‍රතිලාභ ලබන ජනතාවගේ සහභාගිත්වයෙන් බව අවසාන වශයෙන් ප්‍රකාශ කරමි. සියලු වැඩ නිම කළ යුත්තේ පාවිච්චි කරන කණ්ඩායම් විසිනි.

එහෙයින් පාවිච්චි කරන කණ්ඩායම් ප්‍රවර්ධනය ඉදිකිරීම් වැඩ ඇරඹීමට පෙරාතුව සිදු කළ යුතු වේ. සිවිල් වැඩ, පාවිච්චි කරන කණ්ඩායම්වලට කොන්ත්‍රාත්තු මගින් ලබාදිය යුතු අතර, ඔවුනට පුහුණුව හා මූල්‍ය කළමනාකරණ හැකියාව ලබාදිය යුතුයි. කුලී වැඩවලදී එම කණ්ඩායම් බාහිර ශ්‍රමිකයන් හා සසඳන විට එම පළාත්වල ශ්‍රමිකයන් කෙරෙහි විශ්වාසය තබා කටයුතු කරනු ඇත. පරිසර සංරක්ෂණ කාර්ය ක්‍රියාවට නැංවීම සහ ජනතාව දැනුමැති කිරීම පාවිච්චි කරන්නන්ගේ කණ්ඩායම් මගින් ක්‍රියාවට නැංවීම එක් එක් පුද්ගලයන් මගින් සිදුකිරීමට වඩා කාර්යක්ෂමය. වියදම් අඩුය. අඛණ්ඩව කල්පවතිනු ඇත. මේ ගමන් මාර්ගයේ ඇතැම් දිරිගන්වන සුළු උදාහරණ ප්‍රධාන වශයෙන් වාරිමාර්ග අංශයෙන් පෙන්විය හැකිය. මේ මූලධර්මය මේ කාර්යයට එළඹුනු මුල් අවස්ථාවේ සිට අනුගමනය කළ යුතුයි.

පරිසරය කෙරෙහි එලදායී සැලකිල්ල යොමු කරන අතර ඉහත සාකච්ඡා කෙරුණු ක්‍රමෝපායන් අනුගමනය කළ හොත් සුළු වාරිමාර්ග ක්‍රමවල දී මුහුණපෑමට සිදුවන පාරිසරික ගැටළු පිටුදැකිය හැකිවේ. අනාගත සංවර්ධන කාර්යන්හි දී එවන් ක්‍රමෝපායන්ට ප්‍රමුඛත්වය දිය යුතුයි.